VERITÉ
විදසුන්

Originally Published in: [Mawbima, September, 2015]

## ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර පවතින තීරුබදු නොවන බාධක සඳහා පිළියම්

**"ඉන්දියාවත් එක්ක ගිවිසුම ගැහුවොත් අපි නන්නත්තාරද?" යන වෙරිටේ ආයතනය විසින් පළකරන ලද පසුගිය විදශර්නාව මගින් අපනයන වධර්නය කිරීම සඳහා වෙළඳ ගිවිසුම් පිළිබද සාකච්ඡා පැවැත්වීමේදී තීරුබදු ඉවත් කිරීම පිළිබඳ පමණක් අවධානය යොමු කිරීම ප්‍රමාණවත් නොවන බව ඉස්මතු කරයි. මන්ද තීරුබදු නොවන (Non-Tariff Barriers) බාධක අපනයන වලට දැඩි අවහිරතාවක් විය හැකි බැවිණි.ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (Indo-Sri Lanka Free Trade Agreement) තුළ ශක්තිමත් තීරුබදු රහිත ප්‍රවේශයක් සැලසී තිබියදී ශ්‍රී ලංකාවේ සිට ඉන්දියාවට සැකසූ ආහාර අපනයනය කිරීම අපේක්ෂා කළ තරම් පුළුල් නොවීම පිලිබදව මෙහි ගෙනහැර දක්වන ලදී. මෙහිදී අපනයනකරුවන්ට මුහුණ පෑමට සිදුවන තීරුබදු නොවන බාධක මගින් තීරුබදු සහන වලින් ලැබිය හැකි ප්‍රතිලාභ යටපත් කර තිබේ.**

**මෙවර විදශර්නාව මගින් සැකසූ ආහාර අපනයනකරුවන්ට මුහුණ පෑමට සිදුවන සුවිශේෂී තීරුබදු නොවන බාධාවක් සම්බන්ධයෙන් විසඳුමක් පෙන්වා දෙයි. එනම් ඉන්දීය වරායට ඇතුල් වන භාණ්ඩ  ඉන්දීය ප්‍රමිතීන් සහ රෙගුලාසිවලට අනුකූල බව සනාථ කිරීම සඳහා ගතවන කාලය සහ දරන පිරිවැය යන බාධක අඩු කිරීමට ගතහැකි පියවරයන්ය. අනෝන්‍ය පිළිගැනීමේ ගිවිසුමක් (Mutual Recognition Agreement/MRA) මගින් මෙම ගැටළුව විසඳිය හැකි අතර එවැනි ගිවිසුමක ඇති අවශ්‍යතාව සම්බන්ධයෙන් ඉන්දියාව තුලද කිසිදු ප්‍රතිරෝධයක් තිබිය නොහැකි බව මෙයින් පෙන්වා දෙනු ලබයි.**

### වතර්මාන ගැටළුව

**අනුකූලතා තක්සේරු කායර් පරිපාටි (Conformity Assessment Procedures/CAP) ලෙස හඳුන්වනු ලබනුයේ රටක ප්‍රමිතීන් සහ රෙගුලාසි  වලට භාණ්ඩ වල අනුකූලතාව පරික්ෂා කිරීම වේ. මෙම කායර් පරිපාටි මගින් පාරිභෝගිකයන්ගේ සෞඛ්‍යය හා සුරක්ෂිතතාවය ආරක්ෂා කිරීම සහ පරිසරය සුරැකීම වැනි අරමුණු සාක්ෂාත් කර ගත හැක. කෙසේ වෙතත්  අනුකූලතා තක්සේරු කායර් පරිපාටි ක්‍රියාත්මක වීමේදී අපනයනකරුවන්ට දරන්නට වන ඉහළ පිරිවැය, අනිසි ප්‍රමාදවීම් සහ අවිනිශ්චිතතා  තීරුබදු නොවන බාධක බවට පත් වේ. අධික සාම්පල් කරණය, ගබඩා පිරිවැය, භාණ්ඩ  වරායෙන් නිදහස් කිරීමට යන කාලය දිගු සහ අවිනිශ්චිත වීම සැකසූ ආහාර ඵලදායි ලෙස ඉන්දියාවට අපනයනය කිරීමේ හැකියාව සීමා කර ඇත.**

### අසාථර්ක විසඳුම්

**අනුකූලතා තක්සේරු කායර් පරිපාටි(CAP) ක්‍රියාත්මක වීම තුළ අනිසි ලෙස වෙළදාම් කටයුතු සීමා වීම වැළැක්වීම සඳහා ඉන්දියාව සහ ශ්‍රී ලංකාව 2006දී ගිවිසුමකට එළඹ ඇත. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සහ ඉන්දීය ප්‍රමිති කායර්ාංශය (Bureau of Indian Standards) දෙරටෙහි ඇති ප්‍රමිතිවල වෙනස්කම් ඉවත්කර, එකම ප්‍රමිතියකට අනුගත වීම තුළින් (harmonising), එක් රටක අනුකූලතා තක්සේරු කරන ආයතනයකට අනික් රටේ ආයතනය** විසින් නිකුත් කරනු ලබන පර්යේෂණ වාර්තා සහ ප්‍රමිති සහතික **පිළිගැනීම සඳහා අවකාශ සලසා තිබේ. රටවල් අතර ප්‍රමිතීන් අනුගත කිරීම පිණිස වන සාකච්ජා ඉතා මන්දගාමී වීමත්, ගිවිසුම අත්සන් කිරීමෙන් අනතුරුව මේ සඳහා කිසිදු පියවරක් නොගැනීමත් තුළ මෙම ගිවිසුම අදාළ නොවන තත්වයකට පත් වී තිබේ.**

**මිට පෙර 2002දී ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සහ ඉන්දියානු අපනයන පරීක්ෂණ සභාව (Export Inspection Council) විසින් අත්සන් කරන ලද ගිවිසුම මගින් ප්‍රතිලාභ හිමිවූයේ ඉන්දීය අපනයනකරුවන්ට පමණි. මෙම ගිවිසුම යටතේ,** එම සභාව විසින් ප්‍රමිතිය සහතික කරන ලද ඉන්දීය අපනයන ලංකාවේ දී නැවත පරීක්ෂණයකට ලක් නොකර වෙළඳපොල වෙත මුදා හැරිමට ශ්‍රී ලංකාව එකග වී ඇත.  **කෙසේ වුවද මෙම ගිවිසුම එක පාශර්වික වීම මත එය ශ්‍රී ලංකාවේ සිට ඉන්දියාව දක්වා සිදුකරන අපනයන කෙරේ කිසිදු ප්‍රතිලාභයක් අත්කර නොදෙයි.**


### දැනට යෙදිය හැකි විසඳුම

දැනට පවත්නා ඒක පාශර්වික ගිවිසුම ද්වි පාශර්විකව වාසි සැලසීමට නම් එය අනෝන්‍ය අනුකූලතා පිළිගැනීමේ ගිවිසුමක් (MRA) බවට පත් විය යුතුය. මෙවැනි ගිවිසුමක් යටතේ, සෑම රටකටම තම තමන්ගේ ප්‍රමිතීන් සහ රෙගුලාසි වෙනස් නොකර අඛණ්ඩව පවත්වා ගත හැකි බැවින් වඩාත් ඉක්මනින් සහ පහසුවෙන් ක්‍රියාත්මක කළ හැක. මේ අනුව එක් එක් රටවල් විසින් අදාළ රටවල රසායානාගාරවල සුදුසුකම් සහ හැකියාවන් ඇගයුමට භාජනය කිරීමෙන් අනතුරුව එම ආයතන විසින් ප්‍රමිතීන් සහ කොන්දේසි වලට අනුගතව නිකුත් කළ පර්යේෂණ වාර්තා සහ ප්‍රමිති සහතික පිළිගැනීමට එකඟ වෙයි. (1 රූප සටහන බලන්න).

නිෂ්පාදන අපනයනය සිදු කරන අවස්ථාවේදී අනුකූලතාවය තක්සේරුකිරීමත් එය සහතික කිරීමත් නිසා ඉලක්ක වෙළඳපොළට ළගා වීමෙන් අනතුරුව ප්‍රමිති තක්සේරුව නිසාවෙන් ඇතිවිය හැකි අවිනිශ්චිත බවක් හෝ දුෂ්කරතාවයක් පිළිබඳ අපනයනකරු සැක සංකා තබා ගත යුතු නැත. තම රට තුලදී සහතික කිරීමේ ආයතන මගින් අනිසි ප්‍රමාදවීම් සහ වියදම් සිදු නොකරන බවට වග බලා ගැනීමට අපනයනකරුවන්ට සාමාන්‍යයෙන් වැඩි බලයක් හිමිව තිබේ.

අනෝන්‍ය පිළිගැනීමේ ගිවිසුමක් (MRA) යනු ඉක්මන් විසඳුමකි. මන්ද මේ හරහා පළමුව අනුකූලතා සහතික නිකුත් කිරීමේ ඉහළ සුදුසුකම් සහ හැකියාවන් ඇති භාණ්ඩ වලින් ආරම්භ කොට ක්‍රමයෙන් කාලයත් සමග පුළුල් පරාසයක නිෂ්පාදන ආවරණය කිරීමට හැක.

**1** රූපසටහන: අනුකූලතා ඇගයුම පිළිබඳ අනෝන්‍ය පිළිගැනීමේ ගිවිසුම




<u>විස්තීර්ණ ආර්ථික සහයෝගිතා ගිවිසුම (CEPA) අත්සන් කරන තෙක් බලා නොසිටීම</u>

ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර යෝජිත විස්තීර්ණ ආර්ථික සහයෝගිතා ගිවිසුම (CEPA) මගින් අපේක්ෂා කර තිබෙනුයේ අනෝන්‍ය පිළිගැනීමේ ගිවිසුම එකී ආර්ථික සහයෝගිතා ගිවිසුමේ සංරචකයක් බවට පත්කිරීමයි. තවද ඉන්දියාව වෙනත් රටවල් සමග ඇති නව වෙළඳ ගිවිසුම් තුළ මෙම අනෝන්‍ය පිළිගැනීමේ ගිවිසුම අත්සන් කිරීමට ප්‍රතිපාදන සලසා තිබේ. මෙයින් පැහැදිලි වන්නේ අනෝන්‍ය පිළිගැනීමේ ගිවිසුම මෙම ගැටළුවට පිළියමක් බව දෙරටම පිළිගෙන ඇති බවයි.

වෙළඳ ගිවිසුම් අනෝන්‍ය වශයෙන් ඵලදායි වුවත් එය එසේ වන බවට ස්වයංක්‍රීය ඇපවීමක් නොමැත – ගිවිසුමේ සඳහන් කරුණු මෙන්ම කෙටි කාලින සහ මාධ්‍යකාලින අරමුණු ප්‍රතිලාභ අත්වීදීම කෙරෙහි බලපායි. පයේර්ෂණ මගින් පෙන්වා දෙන්නේ නිදහස් වෙළඳ ගිවිසුම තුළ තීරුබදු නොවන බාධක වලට විසඳුම් ලබාදීම සම්බන්ධයෙන් ප්‍රතිපාදන සලසා නොමැතිකම සහ ගැටළුව විසඳීම සඳහා මේ දක්වා ගෙන ඇති ක්‍රියාමාගර් වල දුවර්ලතා හේතුකොටගෙන ඉන්දියාව සමග තවදුරටත් වෙළඳාම් කටයුතු ලිහිල්කරණය තුළින් ලැබිය හැකි ප්‍රතිලාභ පිළිබඳව ශ්‍රී ලාංකික අපනයනකරුවන් තුළ ඇති විශ්වාසය හීන වී ඇති බවයි. එබැවින්, විස්තීර්ණ ආර්ථික සහයෝගිතා

(CEPA) ගිවිසුම තුළින් අනෝන්‍ය පිළිගැනීමේ ගිවිසුම (MRA) ඉවත් කර ක්‍රියාත්මක කළ හැකි වන්නේ නම් එය පළමුව දැනට පවත්නා වෙළඳ ගිවිසුමේ ප්‍රතිලාභ පිළිබඳ පැහැදිලි දැක්මක් සපයා දීම පිණිස උපකාරී විය හැක.

එසේම වත්මන් ගිවිසුමෙන් ලැබිය හැකි ප්‍රතිලාභ පුළුල් කිරීමට කටයුතු කිරීම තුළින්, අනාගතයේ වැඩි අනෝන්‍ය ප්‍රතිලාභ ලගා කර ගැනීම සම්බන්ධයෙන් වෙළඳ ගිවිසුම පුළුල් කිරීම සඳහා ධනාත්මක ආකල්පයක් ඇති කිරීමට එය උපකාරී වනු ඇත.